# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2380/35 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ (පනත) 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් -

*(අ)* අමාත්‍ය මණ්ඩලය විසින් 2024 අප්‍රේල් මස 08 වැනි දින අංක 24/0651/631/016 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත් ;

*(ආ)* ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත් ;

*(ඇ)* පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත් ; සහ

*(ඈ)* නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 6699 — 289 (2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***I* වන උපලේඛනය**

*ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර*

| | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම : | එච්ලන් ට්‍රේඩ් (පීවීටී) එල්ටීඩී |
| 2. බලපත්‍ර අංකය : | 2306200014 |
| 3. බලයලත් තැනැත්තාගේ බලපත්‍රය නිකුත්කරන ලද දිනය | 2023 ඔක්තෝබර් 06<br>බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය. (2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | පීසීසී 00284521 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සඳහා හිමිකම | එච්ලන් ට්‍රේඩ් (පීවීටී) එල්ටීඩී ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි. |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 4 වන දින අංක 2343/60 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 4(2)(අ) සහ 4(3)(අ) වන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනා ක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීමේ හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය. |

***II* වන උපලේඛනය**

*ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු*

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ජාතික යහපත සැළකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සලකා බලා ගෙන ඇත.

එච්ලන් ට්‍රේඩ් (පීවීටී) එල්ටීඩී සමාගම, මුළු ආයෝජනය එක්සත් ජනපද ඩොලර් මිලියන 24.5 ක් වන පරිදි, මූලික ආයෝජනය වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 2 ක් ද, අමතරව දෙවන වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 3 ක්, තුන්වන වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 5 ක් ද, හතරවන වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 6.5 ක් ද, පස්වන වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 8 ක් ද වශයෙන් කොළඹ වරාය නගරය තුළ ක්‍රමෝපාය සහ අදියරමය ආයෝජනයක් සිදු කිරීමට කැප වී සිටියි. චීනය, හොංකොං, ජපානය, සිංගප්පූරුව, ඉන්දියාව, පකිස්ථානය, ඉන්දුනීසියාව, ඇමරිකා එක්සත් ජනපදය, තුර්කිය, තායිලන්තය සහ වියට්නාමය ඇතුළු බහුවිධ ගෝලීය වෙළඳපලවල් හරහා රෙදිපිළි, ඇඟලුම්, සුබෝපභෝගී අත් ඔරලෝසු, රත්‍රන් සහ මැණික්, විදුලි උපකරණ සහ රූපලාවන්‍ය නිෂ්පාදන ආදිය ගෝලීය වශයෙන් වෙළඳාමේ නිරතවීමට එච්ලන් ට්‍රේඩ් සමාගම අරමුණු කරයි.

එච්ලන් ට්‍රේඩ් හි අපේක්ෂිත ව්‍යාපාර ආකෘතිය මගින්, ආර්ථික සැකැස්ම ප්‍රාණවත් කරමින් සහ ශ්‍රී ලංකාව සහ ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳපොළවල් අතර වෙළඳ සම්බන්ධතා ශක්තිමත් කරමින් සැලකිය යුතු ලෙස විදේශ විනිමය රට තුළට ගලා ඒමක් සිදුවනු ඇති බවට පුරෝකථනය කරයි. ඊට අමතරව, එච්ලන් ට්‍රේඩ් හි ව්‍යාප්ත වීම තුළින් මීළඟ වසර 5 ඇතුළත ශ්‍රී ලාංකිකයින් 40 සිට 50 තෙක් වූ ප්‍රමාණයක් සේවයේ නියුක්ත කරමින් කොළඹ වරාය නගරය තුළ රැකියා අවස්ථා සැලකිය යුතු ප්‍රමාණයක් බිහි කිරීමට නියමිත අතර එමගින් දේශීය ආර්ථිකය ශක්තිමත් කරමින් නම්කළ විදේශ ව්‍යවහාර මුදල් වලින් ආදායම් උපයාගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

| *III වන උපලේඛනය*<br><br>*පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්* | |
|---|---|
| **පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්** | **ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** |
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | *(අ)* සියලු ආදායම්, ලාභ සහ බෙදාදෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.<br><br>*(ආ)* කරන ලද සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අයකිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 03 වැනි දින අංක 2282/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

***IV* වන උපලේඛනය**

*ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය*

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භක වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 04 - 0165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.